COPY

12(1)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. } | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 - 12 - 21

පැමිණිලි පාර්ශවය : ඩී.ජී.ජී.දිසානායක මහතා,
අංක. 65/29, තල්වත්ත,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහ/ ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

**පැමිණිලි අංකය : HRC/KND/172/22/I**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් තම දරුවා වන ඩී.ජී.එස්.ඩී.එන්.දිසානායක දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 2022 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා 'ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් පදනම' යටතේ අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු කැඳවීම් අංක RS-125 අනුව 2021.11.09 දින ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේදී තමා විසින් පදිංචිය සනාථ කරන පළමු ලේඛනය වන අංක 3969 දරණ ඔප්පුව හා අංක 67 දරණ විකුණුම්කරය හා අංක 52 දරණ වරද නිවැරදි කිරීමේ ඔප්පුව ඉදිරිපත් කළ අතර, එම ඔප්පුව ව්‍යාජ බවත්, නියමිත කාලයට පසු ලියාපදිංචි වී ඇති බවත්, සඳහන් කරමින් ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බව සඳහන් කර ඇත. අංක 67 දරණ දේපල තුල වරිපනම් අංක 65/30 හා 65/29 දරණ නිවෙස් දෙකක් ඇති අතර, අතපසුවීමක් මඟින් අංක 67 දරණ විකුණුම්කරයේ තම මව පදිංචි පරිපනම් අංක 65/29 ලෙස සටහන් කර තම මව වන හේවාවිතාරනගේ සුවිනීතා සුමනශීලි විසින් අංක 67 දරණ ඔප්පුවෙන් කුෂාන් ගිම්හාන පිරිස් වෙත රු. 800000/= (රුපියල් ලක්ෂ අටකට) 2016.10.09 වන දින විකුණන ලද මුත් එකී සදොස් සහගත වරිපනම් අංකය නිවැරදි කිරීම සඳහා අංක 52 දරණ වරද නිවැරදි කිරීමේ ඔප්පුව 2021.07.21 දින ලියාපදිංචි කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබාදුන්නද ඒ පිළිබඳ කිසිදු පැහැදිලි කිරීමක් සිදුකිරීමට ඉඩනොදී ඔප්පුවේ ගැටළු සහගතභාවයක් ඇති බව සඳහන් කර ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්, කරන ලද අභියාචනාවේදීත් ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මීටර් 500 පමණ දුරින් වන මහ/ධර්මරාජ විද්‍යාලය වෙත තම දරුවා ඇතුළත් කිරීමේ අවස්ථාව අහිමි වූ බවත් පැමිණිල්ලේ තවදුරටත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

වගඋත්තරකාර වාර්තාවේ සඳහන් කරුණු :-

මෙම පැමිණිලිකරු විසින් ඔහුගේ දරුවා වන බී.ඒ.එස්.බී.එන්.දිසානායක මහ/ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා කරන ලද අයදුම්පත අනුව 2021.11.09 වන දින ප්‍රථම සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී පදිංචිය සනාථ කරන මූලික ලේඛනය වන හිමිකම් ඔප්පුව ඉදිරිපත් කළද, එකී ඔප්පුව හා ඊට අදාළ ගොඩනැගිලි දේපල සම්බන්ධව මතුවූ ගැටළු නිසා මූලික සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලද බවට දක්වා ඇත. අංක 67 දරණ විකුණුම්කරය මගින් අංක 65/29 සහිත නිවස එහි හිමිකාරිය වන පැමිණිලිකරුගේ මව විසින් මහතෙල්ගේ කුෂාන් ගිම්හාන පීරිස් වෙත විකුණා ඇති අතර, එහි ඔප්පුව ප්‍රකාරව නිවසේ හිමිකාරීත්වය පැමිණිලිකරුගේ මවට නොමැති බව අනාවරණය වීම මත ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලද බවද දක්වා ඇත. අභියාචනා හා විරෝධතා මණ්ඩලය වෙත අංක 52 යටතේ වරද නිවැරදි කරන ඔප්පුවක් මගින් උක්ත නිවසේ අංකය 65/29 නොව 65/30 විය යුතු බව සඳහන් ලේඛනය ඉදිරිපත් කර ඇති මුත් එම ලේඛනය 2021.07.30 වන දිනෙන් පසු ව සකස් කර ඇති ලේඛනයක් බැවින්ද අධ්‍යාපන ලේකම්ගේ 13/2021 දරණ චක්‍රලේඛනය අනුව එම දිනෙන් පසු (2021.07.30) සකස් කර ඇති ලේඛන පිළිගත නොහැකි බැවින්ද එකී අංක 52 ලේඛනය නොසලකා කටයුතු කරන ලද බවද වැඩිදුරටත් දක්වා ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකරු විසින් ප්‍රථම සම්මුඛ පරීක්ෂණය සඳහා අංක 3969 දරණ ඔප්පුව හා අංක 67 දරණ විකුණුම්කරය ඉදිරිපත් කර ඇති අතර, එකී විකුණුම්කරයේ ඇති ගොඩනැගිලිවල හා දේපොල වල වරිපනම් අංකය වැරදීමකින් අංක 65/29 ලෙස සඳහන් වූ බැවින් එය නිවැරදි කරමින් අංක 52 දරණ වරද නිවැරදි කිරීමේ ඔප්පුව මගින් අදාළ දේපලේ වරිපනම් අංක 65/30 දරණ ගොඩනැගිල්ල ඇති බවත්, සඳහන් කර ප්‍රථම හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළද, එකී 52 දරණ දේපල ලියාපදිංචිව ඇත්තේ, 2021.07.30 දිනෙන් පසුව බැවින් (2021.07.30 දිනෙන් පසුව ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු ලබානොදෙන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින්) විදුහල්පති විසින් ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් සඳහන් කර ඇත්තේ, අදාළ ලේඛන ඉදිරිපත් කළ යුත්තේ අධ්‍යාපන චක්‍රලේඛන 13/2021 අනුව 2021.07.30 දිනට ප්‍රථම බව සඳහන් වන නමුත් අධ්‍යාපන ලේකම්ගේ අංක ED/09/12/11/02/01/ (1) හා 2021.07.26 දිනැති ලේඛනය අනුව පැහැදිලිවන්නේ, රටේ පැවති කොවිඩ් 19 තත්වය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.08.07 දින දක්වා දීර්ඝ වන බවත්, අයදුම්පත් සමඟ ඉදිරිපත් කරනු ලබන ලේඛන 2021.08.07 දිනට පෙර නිකුත් කර ඇත්නම්, එම ලේඛන වලංගු ලෙස සලකා කටයුතු කළ යුතු බවත්ය. ඒ පිළිබඳව වගඋත්තර පාර්ශවය විසින් දැනුවත්වීමක් සිදුව නොමැති බව නිරීක්ෂණය වේ. එනමුත් එම චක්‍රලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සියළුම පළාත් ලේකම්, අධ්‍යක්ෂවරු හා විදුහල්පතිවරු වෙත නිකුත් කර ඇති ප්‍රසිද්ධ ලේඛනයකි. එබැවින් මේ පිළිබඳව විදුහල්පතිතුමා නොදැන සිටියේය යන ප්‍රකාශය පිළිගැනීම අසීරුය.

අංක 52 දරණ වරද නිවැරදි කිරීමේ ඔප්පුව මඟින් පැමිණිලි පාර්ශවය විසින් තහවුරු කිරීමට උත්සහා දරා ඇත්තේ, පැමිණිලිකරුගේ මව විසින් විකුණන ලද වරිපනම් අංකය 65/30 සහිත නිවස, අංක 67 දරණ විකුණුම්කරය තුළ තිබිය යුතු ගොඩනැගිල්ලක් වන අතර, 3969 දරණ ඔප්පුවේ පිහිටි වරිපනම් අංක 65/29 දරණ ගොඩනැගිල්ලේ පැමිණිලිකරු හා මවද සමග ජීවත් වන බවයි. ප්‍රමාද දෝෂයක් හේතුවෙන් වරිපනම් අංක 65/29 දරණ ගොඩනැගිල්ල අංක 67 දරණ විකුණුම්කරයේ සඳහන්ව ඇති බව තවදුරටත් නිරික්ෂණය වේ.

එකී ඔප්පු ප්‍රකාශ තුළින් නිරික්ෂණය වනුයේ, පැමිණිලි පාර්ශවය විසින් වංශනික පරමාර්ථයෙන් කරුණු තහවුරු කිරීමට වඩා නිත්‍යානුකූලව කරුණු තහවුරු කිරීමට උත්සහ දරා ඇති බවයි. එවැනි නිවැරදි කිරීමක් තුළින් යම් ගැටළුවක් පැන නගින්නේ නම්, ප්‍රථම සම්මුඛ පරික්ෂණ මණ්ඩලය විසින් සිදුකළ යුත්තේ ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛණයේ 6.1(අ) අනුව භෞතිකව ස්ථාන පරික්ෂණයක් සිදුකිරීමෙනි. නමුත් පැමිණිලිකරු හට ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට කිසිදු සාධාරණ හේතුවක් නොමැති අතර, එවැනි ලකුණු ලබාදීමක් ප්‍රතික්ෂේප කළ යුත්තේ, 13/2021 දරණ චක්‍රලේඛනය අනුව 9.1 අනුව ව්‍යාජ හෝ කූඨ ලේඛනයක් සාදා ඇති බවට අනාවරණය වීම හෝ පදිංචිය භෞතිකව සනාථ කිරීමට නොහැකි වූ අවස්ථාවල පමණි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2022.08.21 වන දින කරන ලද මූලික විමර්ශනයෙන් පසු අනාවරණය වූ කරුණු මත ලිපියක් යොමු කරමින් දැනුම් දී ඇත්තේ, පැමිණිලිකරුගේ පදිංචිය පිළිබඳ නැවත භෞතිකව පරික්ෂණයක් සිදුකර තහවුරු කරගන්නා ලෙසයි.

නමුත් ඊට පිළිතුරු ලෙස විදුහල්පතිවරයා විසින් දැනුම් දී ඇත්තේ, "අංක 52 දරණ වරද නිවැරදි කිරීමේ ඔප්පුව" අයදුම්පත ඉදිරිපත් කරන විට යොමු කර නොමැති නිසා 13/2021 චක්‍රලේඛණයේ පළමු ඡේදයට අනුව, "සියලුම සුදුසුකම් සපුරාලිය යුත්තේ 2021.06.30 දිනට වලංගු වන පරිදිය" යන කොන්දේසි අනුව සම්මුඛ පරික්ෂණයේදී එය සලකා නොබැලූ බවයි.

අංක ED/09/12/11/02/01 (1) හා 2021.07.26 දිනැති ලිපියේ සියලුම ප්‍රධාන, පළාත් ලේකම්වරු, අධ්‍යක්ෂවරු හා විදුහල්පතිවරුන් වෙත දැනුම් දී ඇත්තේ, කොවිඩ් 19 වසංගත තත්වය මත 2022 වසරේ පාසැල්වල පළමු වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.07.31 දක්වා දීර්ඝ කළද එය තවදුරටත් 2021.08.07 දක්වා නැවත දීර්ඝ කරන බවයි. එහි අවසන් ඡේදයේ පැහැදිලිව දන්වා ඇත්තේ "අයදුම්පත සමග ඉදිරිපත් කරනු ලබන ලේඛන 2021.08.07 දිනට පෙර නිකුත් කර ඇත්නම් එම ලේඛන වලංගු සේ සැලකිය යුතු බවද වැඩිදුරටත් දන්වමි" යන්නයි. නමුත් විදුහල්පතිවරයා හා අභියාචනා පරික්ෂණ මණ්ඩලය විසින් ඒ පිළිබඳ අවධානය යොමු කර නොමැති බව නිරික්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2022.08.21 දින කරන ලද මූලික විමර්ශනයේදී අනාවරණය වී ඇත්තේ, පින්නදූව නැමති අයකු අධිකරණයේ භාරකාරත්වය යටතේ දරුවකු ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කර ඇති අතර, ඔහු ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන විට අධිකරණය මඟින් භාරකාරත්වය ලබාගත් තීන්දුවක් ලබාදී නොතිබූ බැවින්, පළමු සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදී නොතිබූ අතර, පසුව අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අධිකරණ තීන්දුව (දරුවාගේ භාරකාරීත්වය ලබීමේ තීන්දුව) සලකා බලා ලකුණු ලබාදී එම ළමයා ඇතුළත් කර ඇති බවයි. එලෙස ඇතුළත් කර ඇත්තේ, කුමන පදනමින් ද යන්න පරීක්ෂණයේදී වගඋත්තරකාර නියෝජිතයින්ගෙන් විමසීම් කිරීමේදී ඔවුන් ඒ පිළිබඳව දැනුවත්වීමක් නොමැති බවත්, පසුව දැනුම් දෙන බවත් ප්‍රකාශ කිරීම හේතුවෙන් ලිඛිතව විදුහල්පතිවරයාගෙන් විමසීම් කර ඇත. ඊට පිළිතුරු ලෙස විදුහල්පතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ලිපියෙන් දැනුම් දී ඇත්තේ, එස්.ඩී.පින්නදූව මහතාගේ අයදුම්පත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර තිබියදී, අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් ලකුණු දීමක් සිදුකර ඇත්තේ, කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ප්‍රමාද වූ නඩු කටයුතු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2174/4 දරණ අති විශේෂ සහ 2021 අංක 17 දරණ (තාවකාලික) ගැසට් නිවේදනය සහ අනෙකුත් චක්‍ර ලේඛණ පදනම් කරගෙන බවයි.

ඉන් තවදුරටත් නිරීක්ෂණය වනුයේ, පින්නදූව මහතා විසින් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන ලද ලේඛනයක් (අධිකරණ තීන්දුව) පදනම් කරගෙන අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2174/4 ගැසට් නිවේදනය අනුව අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් ලකුණු ලබාදී ඇති නමුත්, පැමිණිලිකරු විසින් ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ලේඛන (අංක 52 වරද නිවැරදි කිරීමේ 2021.07.27 ඔප්පුව) අයදුම්පත් සමඟ ඉදිරිපත් නොකලේ යැයි සඳහන් කරමින් ලකුණු ලබාදී නොමැති බවයි. එසේම "13/2021 චක්‍ර ලේඛනය පරිදි සියලු සුදුසුකම් සපුරා තිබිය යුත්තේ 2021.06.30 දිනට වලංගු වන පරිදිය" යන කොන්දේසිය පැමිණිලිකරු උල්ලංඝනය කර ඇති බවට දැනුම් දී විදුහල්පතිවරයා විසින් කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

01. පැමිණිලි පාර්ශවය විසින් අධ්‍යාපන ලේකම්ගේ අංක ED/09/12/11/02/01 (1) හා 2021.07.26 දරණ ලිපිය අනුව, අංක 52 දරණ වරද නිවැරදි කිරීමේ ඔප්පුව 2021.08.07 දිනට ප්‍රථම ලියාපදිංචි කර ඇති ඔප්පුවක් බැවින් ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පිළිගත යුතු බව කොමිෂන් සභාවේ නිගමනය වේ.

02. එසේ පිළිගත යුතු ලේඛන අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම තුළින් පැමිණිලිකරු හට සාධාරණ විනිශ්චයක් ලැබීමේ යුක්තියේ මූලධර්ම ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

03. පැමිණිලිකරු පදිංචිය පිළිබඳ වඩාත් විනිවිදභාවයකින් තහවුරු කිරීම සඳහා නෛතික ලේඛනයක් නියමිත කාලය තුළ ඉදිරිපත් කර ඇති අතර, ඊට විදුහල්පතිවරයා විසින් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, "ඉල්ලුම්කරු විසින් පදිංචිය තහවුරු කිරීමේ මූලික ලේඛනය ලෙස සලකන හිමිකම් ඔප්පුව හා ඊට අදාළ ගොඩනැගිලි හා දේපල සම්බන්ධයෙන් මතුවූ ගැටළු නිසා මූලික සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී" යන්නයි. පදිංචිය සනාථ කරන මූලික ලේඛනවල යම් ගැටළුවක් ඇත්නම් 13/2021 දරණ චක්‍රලේඛනය 6.1 වගන්තිය අනුව කළයුත්තේ ස්ථාන පරීක්ෂණයක් සිදුකර පදිංචිය තහවුරු කර ගැනීමයි. නමුත් එවැනි ක්‍රියාමාර්ගයක් නොගැනීම තුළින් නීතියේ සර්ව සාධාරණත්වය හා නීතිය පසඳලීමද උල්ලංඝනය කර ඇති බව කොමිෂන් සභාවේ නිගමනය වේ.

04. ඩී.බී.පින්නදූව නැමති අයගේ භාරකාරීත්වය 2021.10.26 දින අධිකරණ තීන්දුවක් මඟින් තහවුරු කර ඇති අතර, එම තහවුරු කිරීම සිදුකර ඇත්තේ, ළමුන් ඇතුළත් කිරීමේ අධ්‍යාපන ලේකම්ගේ අංක ED/09/12/11/02/01 (1) දරණ ලිපියේ සඳහන් දිනට පසුව වන අතර, ඒ පිළිබඳ විමසීමේදී විදුහල්පතිවරයා විසින් ඊට කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, අධිකරණ සේවා චක්‍රලේඛනය 2174/4 අනුව ඇතුළත් කරන ලද බවයි. නමුත් පැමිණිලිකරුගේ අංක 52 දරණ ඔප්පුවේ ප්‍රමාදය සලකා බලා ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 13/2021 චක්‍ර ලේඛනය පදනම් කරගෙන පමණි. නමුත් කොවිඩ් 19 වසංගත තත්වය සලකා බලා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක ED/09/12/11/02/01 (1) ලිපිය පිළිබඳ කිසිදු සලකා බැලීමක් කර නොමැත. ඉන් තවදුරටත් නිගමනය කරනුයේ, එකම කමිටුවකින් සැඳුම්ලත් පරීක්ෂණ මණ්ඩලයක් සමාන සිද්ධියක් සම්බන්ධයෙන් විෂම අයුරින් කටයුතු කර ඇති බවයි.

ඉහත කී නිරීක්ෂණ හා නිගමන අනුව, පැමිණිලිකාර ඩී.ඒ.ජී.ජී දිසානායක මහතාගේ දරුවා වන ඩී.ඒ.එස්.ඩී.එන් දිසානායක දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කරනොගැනීම තුළින් වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලි පාර්ශවීය මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට අනාවරණය වී ඇති බැවින් එකී පැමිණිලිකරුගේ දරුවා වන ඩී.ඒ.එස්.ඩී.එන් දිසානායක සිසුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 2022 පළමු වසර සඳහා ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. Vijitha Nanayakkara**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :

01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

04. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/